**ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර**

**Sri Sumangala College - Panadura**

**ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු**

**1st Term Test - March 2020**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade 10 | විෂයය Subject සිංහල | පත්‍රය Paper I | කාලය Time පැය 02 |

නම :- ........................................................................................ පංතිය :- ..........................

**සැලකිය යුතුයි :-**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රයට ලකුණු 40ක් හිමිවෙ.
- 1 -40 තෙක් ප්‍රශ්නවලට (i), (ii), (iii), (iv) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන උත්තරය තෝරන්න.

---

❖ අංක 1 සිට 5 තෙක් ඇති එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අදහසට වඩාත් සමීප අදහස තෝරන්න.

1) මා සමඟ දිගු කාලයක සිට එක කාමරයේම වාසය කළ ප්‍රියදර්ශන දිනක **"පැඳුරටත් නොකියා"** ගියේ ය.

(i) අමනාප වී (ii) කිසිවෙකුටවත් නොකියා

(iii) හිමිදිරි වේලාවේ (iv) පැඳුර ද අමතක කර

2) ආර්ථික තත්ත්වයෙන් උසස් යැයි සිතා සිටි ඒ තැනැත්තා සෙසු අය **"අත්පල්ලෙන් වැටුනු"** පිරිසක් සේ සලකයි.

(i) අත් පා අක්‍රීය වුණු (ii) අත් පා වාරු නැති

(iii) පිරිසෙන් කොන්වුණු (iv) කාත් කවුරුවත් නැති වුනු

3) මන්ත්‍රීවරයා තම ඡන්දදායින්ගේ කැමැත්ත ආරක්ෂා කර ගැනීම සඳහා **"අන්තිම ඉත්තාත්"** ඇද්දේ ය.

(i) අවසාන උත්සහයත් ගැනීම. (ii) අනුවණ කාර්‍යයක් කිරීම.

(iii) කෛරාටිකකමක් සිදු කිරීම. (iv) ආධාරයක් කිරීම.

4) විදේශ රටක සේවය කොට මෙහි පැමිණි ඔහු **"කුමාර ලීලාමන්"**

(i) ළමයින් මෙන් (ii) නොදැනුවත්වම

(iii) අත් දිග හැර (iv) නොසැලිකිලිමත්

5) ආසාධාරණ ලෙස මුදල ඉපවූ ඔහුගේ **"බහින කලාව"** ලංව ඇති බව බොහෝ දෙනා පැවසූහ.

(i) වාසනාව (ii) පිරිහීම

(iii) අසනීප වීම (iv) අපවිත්‍රතාව

❖ අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැලපෙන වඩාත්ම සුදුසු පදය තෝරන්න.

6) වැටුප් …………………. ඉවත් කරන්නැයි ඉල්ලීම් කරමින් සේවක පිරිස උද්ඝෝෂණය කළහ.

(i) සංකුලතා (ii) අවශ්‍යතා

(iii) විෂමතා (iv) ඵලදායිතා

7) පොළෝ තලයේ වසන සත්වයන්ගේ …………………. සිදු වූයේ සාගරයේ යැයි විද්‍යාඥයෝ පවසති.

(i) සම්භාව්‍ය (ii) සංහාරය

(iii) නිරුක්තිය (iv) සම්භවය

8) තාරකා විද්‍යාඥයෝ උපකරණ භාවිතයෙන් ග්‍රහවස්තුන්ගේ පිහිටීම …………………. කර අනාවැකි එළ කරති.

(i) පරීක්ෂණය (ii) නිරීක්ෂණය

(iii) අධීක්ෂණය (iv) අන්වේක්ෂණය

9) අධ්‍යාපනයේ දී …………………. හිමිවිය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නොව ගුණාත්මකභාවයටය.

(i) ප්‍රමුඛත්වය (ii) උචිතත්වය

(iii) යෝග්‍යත්වය (iv) ප්‍රබලත්වය

10) අපූර්ව වස්තුවක් නිර්මාණය කිරීමේ හැකියාව …………………. නම් වේ.

(i) පරිකල්පනය (ii) ආකාස්මික බව

(iii) ප්‍රතිභාව (iv) ප්‍රතිශක්තිය

11) උකාරාදී පිළිවෙළ නිවැරදිව දක්වෙන පද පේළිය තෝරන්න.

(i) අටළුගම, අකුරණ, බේරුවල, කන්දකාඩු

(ii) අකුරණ, අටළුගම, කන්දාකාඩු, බේරුවල

(iii) අටළුගම, අකුරණ, කන්දකාඩු, බේරුවල

(iv) අකුරණ, අටළුගම, බේරුවල, කන්දකාඩු

12) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(i) වීරෝදාර, මර්දනය, ප්‍රතිඵල, ප්‍රස්තාවතාව

(ii) දර්ශන, විමර්ශණ, සර්ෂණ, තීක්ෂණ

(iii) නර්ථන, නිශ්ශංකමල්ල, ලංකේශ්වර, වර්ධනය

(iv) නින්දාලාප, කර්ණසායන, සංශරණය, ප්‍රතිලාභ

13) එක් එක් වචනයේ දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දිර්ඝපිල්ල, ඇදය හා ගැලපිල්ල අනුපිළිවෙලින් යෙදී ඇති වර්ණය තෝරන්න.

(i) අභූත, විවෘත්ත, අලියා, නිවැරදි

(ii) අලියා, අභූත, විවෘත්ත, නිවැරදි

(iii) විවෘත්ත, අලියා, නිවැරදි, අභූත

(iv) අලියා, අභූත, නිවැරදි, විවෘත්ත

14) "ප්‍රසංග + ඉක" යන ප්‍රකෘත්තිය හා ප්‍රත්‍ය එක් වූ විට නිවැරදිව දක්වෙන වර්ණය තෝරන්න.

(i) ප්‍රාසාංගික (ii) ප්‍රාසංගික

(iii) ප්‍රසංගික (iv) ප්‍රසාංගික

15) උක්ත පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(i) අම්මා, තාත්තා, මා, අයියා

(ii) ඔවුන්, උන්, එය, සමහරුන්

(iii) ආයෙත්, කෙනෙක්, සමහරු, මම

(iv) ගුරුවරුන්, මම, අම්මා, අපි

16) වත්මන් තරුණ පරපුරට සාහිත්‍ය මූලධර්ම පිළිබඳ "පෘථුල" අවබෝධයක් නැත.

(i) පළල් (ii) ගැඹුරු

(iii) පරිනත (iv) ප්‍රමාණවත්

17) යුද්ධයෙන් දිනීමට නම් සතුරු සේනා "මූලෝත්ඝාටනය" කල යුතුය.

(i) උදුරා දැමීම (ii) ඝාතනය

(iii) මුලිනුපුටා දැමීම (iv) ජේදනය

18) "ප" යනු "ඕෂ්ඨජ" අක්ෂරයකි.

(i) උගුර (ii) තොල් (iii) දිව (iv) දත්

19) සීගිරි ගී ලියවුන් අතර "විදග්ධ" කවීන් සිටි බව කියවේ.

(i) විශේෂ (ii) ප්‍රසිද්ධ (iii) විදේශීය (iv) නිපුණ

20) "යථෝක්ත" කාරණය පිළිබඳ ව සැලිකිලිමත් වන ලෙස තම සේවකයන්ට පැවසීය.

(i) ඉහත කියන ලද (ii) දන්වන ලද

(iii) විශේෂයෙන් කියන ලද (iv) කීමට අපේක්ෂා කරන

21) " කොඳු ඇට පෙලක් දරන සතුන්" සඳහා යෙදෙන තනි පදය වන්නේ,

(i) ක්ෂීරපායින් (ii) පෘෂ්ඨවංශීන්

(iii) බහු සෛලික (iv) කාටිලේජය

22) සෑම පදයකම අර්ධ ස්වරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(i) පෞද්ගලික, යතුර, කවියා, ග්‍රන්ථ

(ii) සවිය, යතුර, පෙළ, රකුසා

(iii) වරලස, සවිය, යතුර, රකුසා

(iv) නොහොත්, යතුර, කවියා, පෙළ

❖ අංක 23 සිට 25 තෙක් එක් එක් ප්‍රකාශයන්හි අදහසට වඩාත් ගැලපෙන ප්‍රස්තාව පිරුල තෝරන්න.

23) නොදනෙන ලෙස සතුරුකම් කිරීම.

(i) දිව දෙකේ මිනිසෙක් (ii) දිය රෙද්දෙන් බෙල්ල කැපීම

(iii) දියෙන් ගිනි නැගුනා සේ (iv) දෙකට දෙවාරමේ සිටිනවා

24) වැඩකට නැති වැඩක් කිරීම

(i) ලිහා බැලූ මල්ල ඔබා බැලීම (ii) රූකඩයක් වගේ උන්නා

(iii) ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ (iv) මුනින් නැමූ කලය වගෙයි.

25) අයුතු ලෙස ලාභ හා වාසි ලබා ගැනීම

(i) විද්දේ හාවාට වැදුනේ පඳුරට (ii) ලොකු ලොකු ඒවා තමන්ගේ මල්ලට

(iii) හතර වරං ගහනවා (iv) සෙක්කුවේ බැන්ද ගොනා වගේ

26) හේන් ගොවිතැන් ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී වාංපතුල් යනු,

(i) මර උගුල්ය (ii) රූකඩයක් වගේ උන්නා

(iii) සතුන්ගේ හම් (iv) වඳුරු පාදයන්

27) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

"මං ඉඳලා හිටලා වෙල පැත්තට යනවා"

(i) මං කලාතුරකින් කුඹුර දෙසට යමි.

(ii) මම බෙහෝ කලකට පසුව කුඹුරට යමි.

(iii) මම ඉඳ හිට කුඹුර දෙසට ගොස් පැමිණියෙමි.

(iv) මම මාස කිහිපයකට පසුව කුඹුරට යමි.

28) පහත සඳහන් කවියේ තුන්වන පදය තෝරන්න.

පෙර විරුවන් ඔබගේ පුතේ

ඉඳිකල වැව් බලන් පුතේ

……………………………...

ඒ මහ වැව් බැඳුනේ පුතේ

(i) දෑ උරුමය ඇතිව සිතේ

(ii) දෑතේ සවියෙනුයි පුතේ

(iii) සුරු විරුකම් ඔබට ඇතේ

(iv) මව් බිම දෙස බලන් පුතේ

29) පහත දී ඇති අක්ෂර ගැලපීමෙන් සූචනය වන නිවැරදි රාජ නාමය ඇතුලත් වරණය තෝරන්න.

(i) ගැටදුණුමු

(ii) සබෝසිගිරිය

(iii) ජව්යහුබා

(iv) රාජක්බාක්‍රම

30) සඤ්ඤාත අක්ෂර, අනුස්වාරය, මූර්ධජ අක්ෂරය පිළිවෙලින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(i) ගංඟාව, ශාස්ත්‍රය, ළහිරු

(ii) වංශය, ගඟ, පාෂාණ

(iii) ළදරුවා, පංකාඳු, ණය

(iv) දඹල, පිං කැටය, පණනල

31) රූපකයක් සහිත වරණය තෝරන්න.

(i) රන් කුරහන් මල සේමා

(ii) නවාතැන්පොළ ඔබයි ඔබගේ සිනහවයි

(iii) රන් රස සේ එක් වී සිතැගි ලෙදා

(iv) සුර සෙනගට සුරසුන් පැනවූ වැනි

32) කුමරිය <u>නැඟිට</u> සොරා <u>සොයමින්</u> මාළිගයෙන් <u>බසද්දී</u> <u>නැලසත්</u> වා යි කවුදෝ කියනු ඇසිණි. මෙහි ඉරි ඇඳ ඇති ක්‍රියා පද නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.,

(i) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අශිර්වාද ක්‍රියා

(ii) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(iii) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අශිර්වාද ක්‍රියා

(iv) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අශිර්වාද ක්‍රියා

❖ අංක 33 සහ 34 ප්‍රශ්නවලට පහත කවිය කියවා උත්තර ලකුණු කරන්න.

සතොස් කරන වීනා නඳ ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොඳුරට
වෙසෙස් රුවින් තම මැව්වත් බඹ හට
සඳැස් සවන් නොකලැයි වූ නොසතුට

33) මේ කවියෙන් කියවෙන්නේ,

(i) දිව්‍ය ලෝකයකි. (ii) වන සුන්දරත්වයකි.

(iii) මහා බඹා ගැන වර්ණනයකි. (iv) වීනා නදට ලොබ කළ මොනරුන් ගැනය.

34) මොනරු නොසතුටු වූයේ,

(i) ගොඳුරු නැතිවය (ii) පිලෙහි ඇස සබන් නොකළාටය

(iii) වීණා හඬ නැසුන නිසාය. (iv) මහ බඹා නොපැමිණි නිසාය.

❖ අංක 35 සිට 37 දක්වා ඇති ප්‍රශ්නවලට මුලින් දැක්වෙන වාක්‍යයේ අදහස වඩාත් හොඳින් ඉදිරිපත් වන වරණය තෝරන්න.

35) ධනවත් ජාතීන්ගේ ආධාර උපකාර නැතිව ලෝක ආහාර හිඟයට පිළියම් යෙදීම අසීරු කරුණකි.

(i) ලෝක ආහාර හිඟය නැති කිරීමේ කටයුතු ධනවත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට ඇතුලත් ය.

(ii) ලෝකයේ කෘතිම ආහාර හිඟයක් මවා පෙන්වීමට ධනවත් රටවල් බලවත් උත්සහයක යෙදෙයි.

(iii) ලෝක ආහාර හිඟය නැති කිරීම සඳහා පොහොසත් ජාතීන්ගේ දායකත්වය අවශ්‍යය.

(iv) ඇතැම් ජාතීන්ගේ අවධානය යොමු වී ඇත්තේ ලෝකයේ ආහාර සුලභ කිරීම කෙරෙහිය.

36) ළමා පරපුර සාහිත්‍ය රසවින්දනයට යොමු කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් සාර්ථක ලෙෂ යොදාගත හැකිය.

(i) රූපවාහිනී වැඩසටහන් මඟින් සාහිත්‍ය රසවිදීමට ළමයින් උනන්දු කරවීමට පුළුවන.

(ii) ළමයින් සාහිත්‍ය රසවින්දනය පිළිබඳ මුල් අත්දැකීම ලබා ගන්නේ රූපවාහිනය නැරඹීමෙනි.

(iii) රූපවාහිනියේ බලපෑම මත සාහිත්‍ය රසවින්දනය ළමයින්ගේ විනෝදාංශය බවට පත්වී ඇත.

(iv) සාහිත්‍ය රසවින්දය හා ළමා පරපුර අතර පැවතිය යුත්තේ අඛණ්ඩ සම්බන්ධයකි.

❖ පහත සඳහන් ඡේදය කියවා 37 සිට 40 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරන්න.

නිශ්ශංකමල්ලගේ භාග්‍යශීලීභාවය පිළිබඳව යට දැක්වූ විස්තරවල සැලකිය යුතු අතිශෝක්තියත් ගැබ් වී ඇති බව නිසැකව කිව හැකිය. එහෙත් මේ තොරතුරුවල කිසියම් සත්‍යයක් පදනම් වී ඇතැයි කිව හැකි වන්නේ ඒවා සමකාලීන ලේඛනවල දක්නට නොලැබෙන අන්දමේ තියුණු ස්වරයකින් මොහුගේ ත්‍යාගශීලිභාවය වර්ණාවට නංවා තිබීමත් නිසාය. රටවැසියාගේ ආර්ථික ශුභ සිද්ධිය සඳහා ක්‍රියා කිරීමෙන් දිවයින කාලිංග ආධිපතත්‍යයට අවනත කර ගැනීමට නිශ්ශංක මල්ල වෙහෙසීතැයි සිතීම බෙහෙවින් සාධාරණය. එහෙත් දිළිඳුබවේ නිමග්න වූවන් දුකින් මුදවනු සඳහා ඔහු ප්‍රදානය කළ ත්‍යාගශීලී දීමනා හඟවන නවරත්න දාන වර්ෂා, රන් රිදී වැහේ ආදී පාඨ ඇත්ත වශයෙන් ම සත්‍ය යැයි කීම නොහැකිය.

37) අතිශෝක්තිය යනු කුමක් දැයි නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) වක්‍රෝක්තිය යන්නය.

(ii) පමණ ඉක්මවා කීමත් යන්නය.

(iii) සම්මන්ත්‍රණයක් යන්නය.

(iv) කුමන්ත්‍රණයක් යන්නය.

38) "සමකාලීන ලේඛනවල" යන්නේ අදහස කුමක් ද?

(i) සමාන කාලයට අයත් ලියවිලි යන්නය.

(ii) අතීතකාලයට අයත් ලියවිලි යන්නය.

(iii) අනාගත කාලයට අයත් ලියවිලි යන්නය.

(iv) කාලයට නොගැලපෙන ලියවිලි යන්නය.

39) මෙහි සඳහන් නිශ්ශංකමල්ල රජු රට වැසියාගේ දියුණුවට ක්‍රියා කළේ.

(i) වැඩිවශයෙන් අයබදු අය කර ගැනීමට ය.

(ii) එසේ කිරීමේ අවශ්‍යතාවය නිසාය.

(iii) අතිශෝක්තියෙන් වර්ණනා කර ගැනීමට ය.

(iv) කාලිංග බලයට රට අවනත කරවා ගැනීමට ය.

40) මේ පාඨයේ ඇතුලත් "නරපතියන්ගේ" යන්නේ අර්ථයට අදාළ නොවන පදය තෝරන්න.

(i) මහිපාල (ii) භූපති

(iii) තිනෙත් (iv) නිරිඳු

**11 කොටස**

සැලකිය යුතුයි :-

- (1) සිට ( ) තෙක් ඇති සියලුම ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.
- කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය යොදා ඉදිරියෙන් ඉරක් අඳින්න.

01

I. (අ) අනුස්වාරය සහිත වචනයක් ද,

(ආ) විසර්ගය සහිත වචනයක් ද ලියන්න.

II. දිවේ මුල කොටස උගුර ලෙසට ලංවීමෙන් උපදින ශබ්දය "කණ්ඨජ" වේ නම්,

(අ) දිවේ මැද කොටස තල්ලවෙත සමීපවීම නිසා උපදින ශබ්දය සඳහා යෙදෙන නම ලියන්න.

(ආ) දිවේ අග කොටස උඩු දත් වැටියේ ස්පර්ෂ වීමෙන් උපදින ශබ්ද සඳහා යෙදෙන නම ලියන්න.

III. පහත සඳහන් පද්‍ය කණ්ඩ දෙකෙහි තද කළු අකුරින් මුද්‍රිත පද වල ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) **වැඳ** රජ පද කමල .....

(ආ) **නොකරන්** එලෙස පියතුමනෝ අණ .....

IV. යුගල පද සම්පූර්ණ කරන්න.

(අ) ..................................පවිත්‍ර

(ආ) වන්දනා................................

V. බලයි යන ක්‍රියා පදයේ,

(අ) පූර්ව ක්‍රියා පදය ලියන්න.

(ආ) ප්‍රයෝජ්‍ය ක්‍රියාපදය ලියන්න.

VI. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාර පදවල පොදු ව්‍යවහාරය ලියන්න.

(අ) සකලයා

(ආ) හින්නා

VII. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ආයතන ප්‍රධානියා ඔවුන් කැඳවිය.

(ආ) ගොවියෝ කුඹුරේ සිටින කුරුල්ලන් එලවති.

VIII. පහත පිරිළුවල අරුත පහදන්න.

(අ) ගසෙන් වැටුනු මිනිහට ගොනා ඇන්නා වගේ,

(ආ) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ

IX. පහත දැක්වෙන පද සඳහා විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) පළල

(ආ) සරල

X. පහත දැක්වෙන වාක්‍යයේ ඇතුලත් යුගල පද දෙක තෝරා වෙන වෙනම ලියන්න.

"ගෙවල් දොරවල් බැලීමට ආ තරුණයාගේ වං හුං දැනගත් මව් පියන් ඔහුට අකමැති වූහ."

(ලකුණු 2 × 10 = 20)

02. පහත සඳහන් (අ) (ආ) (ඉ) (ඊ) විස්තර කොටස් අතුරින් එකක් තෝරා වචන 250කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් යොදන්න.

(අ) ශ්‍රී ලංකාව ආකර්ෂණීය සුන්දර දිවයිනකි. මෙහි ඇත්තේ ඉතාම දුර්ලභ වටිනා වනාන්තරයකි. එසේම එහි ඇති සම්පත් අතර වන ජිවීන්ට වඩාත් වැදගත් තැනක් ලැබේ. ඔවුහු පරිසරය සුන්දර කරති. එම සම්පත රැකගැනීම අප සතු යුතුකමකි.

(ආ) ස්භාවික විපත් හා අපදා තත්ත්ව ගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් නිතර අසන්නට ලැබේ. ගංවතුර, නායයාම්, නියගඟ වැනි තත්ත්ව ඒ අතර ප්‍රමාධ වේ. මිනිසාට ජීවය ගෙන දෙන පරිසරයට මිනිසා විසින්ම

කරනු ලබන විවිධ අකටයුතුකම් නිසා ස්භාවධර්මය මිනිසාට එරෙහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ස්භාවික ව්‍යසන ඇතිවේ යැයි සැලකේ. එම නිසා ස්භාවික විපත්වලින් ජනතාව මුදවා ගැනීමත් එමගින් විනාශවන දේපල හා ජීවීන් රැක ගැනීමත් සඳහා ක්‍රමෝපාය යෙදීම මිනිසාගේ පරම යුතුකම බව කිව යුතුය.

(ඉ) ලෝකය නවීන තාක්ෂණය මත රඳා පවති. තාක්ෂණයත් සමග තරුණ පරපුර පරිසනකය ඔස්සේ සමාජ වෙබ් අඩවි, මුහුණු පොත, අන්තර්ජාලය හා බැඳී සිටී. මේ නිසා යහපත් මෙන්ම අයහපත් ද සිදුවීම් කණගාටුවට කරුණකි. අධ්‍යාපනය හා අවශ්‍යය.

(ඊ) වර්තමානයේ කසළ කඳු නිර්මාණය නව ලොව ජය ගැනීමට පමණක් තාක්ෂණය යොදා ගැනීම සඳහා වැඩිහිටි ආදර්ශය සමග මඟ පෙන්වීමද වීම සෑම ප්‍රදේශයකම දැකිය හැකි ගැටලුවකි. කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා පියවර ගැනීම අත්‍යාවශය කරුණකි. ප්ලාසිටික්, පොලිතින්, වැනි අපද්‍රව්‍ය අවම කර ගැනීමට කටයුතු කිරීම පෞද්ගලිකවම සිදුවන්නේ නම් මෙවැනි ගැටලු උද්ගත නොවේ. එමෙන්ම කසල වර්ගකර නිසි ක්‍රමවේදයන් සහිතව බැහැර කිරීමට පුරුදුවීම අපගේ යුතුකමකි. (ලකුණු 25)

03. පහත දැක්වෙන කොටසේ සාරාංශය වචන 50 - 60 අතර සංඛ්‍යාවකින් ලියන්න. වචන ගණනද සාරාංශය අග ලියන්න.

කුතුහලය දනවන, කුතුහලය අවුස්සන, සංවේගය දනවන අදහස් භාවතීෂ පුවත් ලෙස හැඳින්වේ. රාජ්‍ය විරෝධී සටන් අරගල, ප්‍රචණ්ඩ ක්‍රියා, මිනිස් ඝාතන, ස්ත්‍රී පුරුෂ හා දිවිනසා ගැනීම් ආදී සිද්ධි භාවිතයෙන් පුවත් නිර්මාණය කරයි. මෙවැනි පුවත්වලට ජනතාව වැඩි අවදානයක් යොමු කරති. වැඩි කැමැත්තක් දක්වති. මෙවැන් ප්‍රවෘත්ති මුලාශ්‍ර කොටගෙන නිර්මාණය වන විශේෂාංග ලිපිවලට ජනතාවගේ ප්‍රියතාවයක් දැක්වීමට පුළුවන. ඕනෑම රටක් මෙවැනි භාවතීෂ පුවත් ඉක්මනින් අලෙවි කර ගැනීමේ හැකියාවක් ඇත. මේ නිසා මද්‍රිත මාධ්‍යයේත්, විද්‍යුත් මාධ්‍යයේත් .. පුවත්වලට විශේෂ තැනක් හිමිකර දී ඇත. තරඟකාරී වන මුද්‍රිත මාධ්‍ය තම තමන්ගේ පුවත්පතේ වැඩි අලෙවිය සඳහාත් විද්‍යුත් මාධ්‍ය තම නාලිකා වලට වැඩි ප්‍රේක්ෂක ශ්‍රාවක අපේක්ෂකයන් යොමු කර ගැනීම සඳහාත් මෙවන් භාවතීෂ පුවත් වලට විශේෂ අවදානයක් යොමු කරයි. මේ නිසාම මෙවැනි භාවතීෂ පුවත් මූලාශ්‍රකොට ගෙන විශේෂාංග ද සකස් වේ. භාවනීය පුවත් මෙන්ම විශේෂාංගද ඉතා සරල හා ලිහිල් ව්‍යවහාරකින් පාඨකයා වෙත ප්‍රේෂ්යකයා වෙත ඉදිරිපත් කරයි. ඒ පොදු පාඨකයාගේ, ශ්‍රාවකයාගේ, ප්‍රේෂකයාගේ අවධානය හා ආකර්ෂණය නොඅඩුව ලබා ගැනීමේ මූලික අරමුණ ඇතිවිය. මෙවැනි භාවතීෂ ප්‍රවෘත්ති හා වාර්තාමය විශේෂාංග සඳහා වැඩිදෙනා කැමැත්තක් දක්වුවද ජනමාධ්‍යවේදීන් සමතුලිත බවෙන් තොරව භාවෝපකරණ මනෝභාවයෙන් යුතුව පාඨක, ශ්‍රාවක, ප්‍රේක්ෂක පිරිසට කුතුහලය ඇවිස්සීමේ නැතහොත් හැඟීම් උද්දීපනය කිරීමේ අරමුණින් පැන මෙහෙයවුවහොත් එයින් සමාජයට අයහපතක් මිස යහපතක් සිදුනොවේ. (ලකුණු 10)

04. පහත සඳහන් කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති. ඔවුන් අපගේ පිපාසය සංසිඳුවති. අපගේ ඔරු ද පාරු ද ගෙන යති. අපගේ දරුවන් පෝෂණය කරති. අපි මේ භූමිය ඔබට විකුණුවහොත් මේ ගංගාවන් අපගේත් ඔබගේත් සහෝදරයන් බව අමතක නොකරණු මැනවි. ඔබේ දරුවන්ට ද එය කියා දෙනු මැනවි. එතැන් සිට වෙනත් ඕනෑම සහෝදරයකුට දක්වන කරුණාව ගංගාවලටද දක්වනු මැනවි. ගිරි ශිඛරය වසා සිටින හිමිදිර මීදුම උදාවන හිරු ඉදිරියේ පලා යන්නා සේ සුදු මිනිසාගේ ආක්‍රමණය ඉදිරියේ රතු මිනිසා හැම විටම පලාගොස් ඇත. එහෙත් අපගේ පියවරුන්ගේ භෂ්මාවශේෂ අපට පූජනීය වන්නේ ය. එහෙයින් මේ කඳු මේ තුරු ලතා සහ මේ බිම අපටම කැප වූ භූමයකි. සුදු මිනිසුන් ඔබ අපගේ සිරිත් විරිත් නොදන්නා බව අප දනිමු. ඔබට එක් බිම් කඩක් තවත් බිම් කඩකට වඩා වෙනස් නොවේ. රාත්‍රී කාලයේ පැමිණ භූමියේ තිබිය යුතු දේ පැහැරගෙන පලායන ඔබගේ මිනිස්සු මේ භූමියට පිටස්තරයෙක් වන්නාහ. පොළව ඔවුනට සහෝදරයකු නොව සතුරෙකි.

(i) "ගංගාවෝ අපගේ සහෝදරයෝ වෙති." යන්න සනාථ කරවන කරුණු දෙකක් දක්වන්න.

(ii) සුදු මිනිසාගේ ආක්‍රමණය ඉදිරියේ රතු මිනිසා හැම විටම පලායයි යන්න සඳහා යොදා ඇති උපමාව ලියන්න.

(ii) මේ භූමියට පිටස්තරයෝ වන්නේ කවුරුහු ද?

(ii) "ඔවුහු අපගේ පිපාසය සංසිඳවති" යන්නෙන් ඔවුහු යනුවෙන් අදහස් කළේ කවරහුද?

(ii) මේවායේ අර්ථ පැහැදිලි කරන්න.

(අ) ගිරි ශිඛර (ආ) භෂ්මාවශේෂ (ලකුණු - 10)

05. ඔබේ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා ක්‍රමානුකූල වූ න්‍යාය පත්‍රයක් පිළියෙල කරන්න. පෙ.ව 2.00 සිට ප.ව 6.00 දක්වා. කාලය ඊට උපයෝගි කරගන්න.

<u>නැතහොත්</u>

ශ්‍රී සුමංගල විද්‍යාලයේ පරිසර සංගමයේ ලේකම් සුපුන් කරුණාරත්න ඔබ යැයි සිතන්න. පරිසර සංගමය මඟින් පාසලේ පරිසර අලංකරණ ව්‍යාපෘතියක් සකස් කර ඇති අතර ඒ සඳහා අනුග්‍රහකයෙක් තවමත් ඉදිරිපත් වී නොමැත. එබැවින් එහි අනුග්‍රහකත්වය ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ශ්‍රී සුමංගල විද්‍යාලයේ ආදීශිෂ්‍ය සංගමයේ ලේකම් වෙත යැවෙන ලිපිය සකස් කරන්න. (ලකුණු 15)